**රත්නපුර මහා නගර සභාව - 2023**
---------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රත්නපුර මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උපචිත වියදම් හා ලැබිය යුතු එක්වන් මුදල් රු.38,631,466ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජ'නල් මඟින් හා 2024 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ඉදි කිරීම් 07ක ණයහිමි වටිනාකම රු.8,846,959ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2024 ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි කරනු ලැබේ. | - එම - |
| (ඇ) | රු.18,301,221ක ඉදි කිරීම් 03ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඈ) | අපහරණය කළ රු.370,038ක වත්කම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 08ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂ හා උපයෝගී ලේඛන අනුව ශේෂ අතර රු.51,159,604ක වෙනසක් විය. | සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. | වෙනස්කම් නිරවුල් කළ යුතු වේ. |

### 1.6.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිරි දීමනා ගෙවීම සඳහා නෛතික ප්‍රතිපාදන කිසිවක් නොතිබියදී, හිමිකම් ඔප්පුවල මුද්දර ගාස්තු හඳුනා ගැනීමට නිලධාරීන් 14 දෙනෙකුට රු.498,910ක් දිරි දීමනා ලෙස ගෙවා තිබුණි. | මේ සඳහා ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගැනීම සඳහා යොමුකර ඇත. | විධිමත් අනුමැතියකින් තොරව ගෙවීම් නොකළ යුතු වේ. |
| (ආ) | සභා බල සීමාවෙන් පිටත ගලි සේවා සැපයීම වෙනුවෙන් ගෙවූ යැපීම් දීමනාවලින් සියයට 25ක් වූ රු.596,800ක් සෞඛ්‍ය පරිපාලක ද, සියයට 22ක් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 05 දෙනෙකු ද ලබා ගෙන ඉතිරි සියයට 47ක් එම සේවාව සත්‍ය වශයෙන්ම සපයන ගලිරථ රියැදුරු හා කම්කරු වෙත ගෙවා තිබීම ප්‍රශ්නගත විය. එමෙන්ම එම මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් ඔවුන්ගේ රාජකාරී කටයුතු | මහා නගර සභා ආඥා පනතේ 188(1)(ඉ) වගන්තිය යටතේ විෂබීජනාශක ස්ථාන/ වැසිකිළි කැසිකිළි සම්බන්ධව ගෙවීම් කළ හැකි බව දක්වා ඇත. | - එම - |

සඳහා පරිවර්තිත ගමන් වියදම් දීමනා ද ලබාගෙන තිබුණි.

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.63,989,014ක් වූ ගිණුම් විෂයයන් 04ක විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොවුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | විගණනය සඳහා සාක්ෂි ලබා දිය යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 571 (2) අනුව, 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාළ රු.2,207,916ක් වූ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හා සේවක අර්ථ සාධක අරමුදලට අයත් තැන්පත් නිරවුල් කර නොතිබුණි | තැන්පත් ගිණුමේ ඉතිරිව ඇති මුදල් ඒ එක් එක් කාර්යය අවසානයේදී පියවීම් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 12.3 වගන්තියට පටහැනිව, පරිවර්තිත ගමන් වියදම් දීමනා ලබා ගන්නා නිලධාරීන් 10 දෙනෙකු රාජකාරී සඳහා රජයේ වාහන භාවිතා කර තිබුණි. 2023 වර්ෂයේ මාස 03ක් තුළ පමණක් එම වාහන සඳහා ඉන්ධන වෙනුවෙන් රු.189,256ක් වැයකර තිබුණි. | චක්‍රලේඛය අනුව හිමි පරිවර්තිත දීමනාව ලබාගෙන ඇති අතර අත්‍යාවශ්‍ය රාජකාරී සඳහා වාහන භාවිතා කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.65,567,753ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.77,075,195ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 35,800,000 | 40,242,108 | 41,336,757 | 38,436,194 | 35,700,000 | 35,811,543 | 32,284,460 | 39,878,569 |
| කුලී | 73,181,000 | 74,250,118 | 71,876,826 | 34,800,242 | 78,990,000 | 61,612,508 | 59,030,279 | 41,708,638 |
| බලපත්‍ර ගාස්තු | 18,485,000 | 17,954,340 | 15,560,390 | 9,285,500 | 18,556,000 | 18,511,110 | 15,134,679 | 7,910,175 |
| වෙනත් ආදායම් | 114,306,000 | 95,783,213 | 93,617,268 | 7,464,313 | 78,061,000 | 74,082,280 | 77,594,480 | 9,154,106 |
| | 241,772,000 | 228,229,779 | 222,391,241 | 89,986,249 | 211,307,000 | 190,017,441 | 184,043,898 | 98,651,488 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාවකාලික දැන්වීම් වෙනුවෙන් ගැසට් නිවේදනය පරිදි ගාස්තු අය නොකිරීම නිසා 2023 වර්ෂයේ මාස 04ක් සඳහා දැන්වීම් පුවරු 28ක් වෙනුවෙන් පමණක් රු.137,760ක ආදායමක් අහිමි වී තිබුණි. විගණනය විසින් මේ බව පෙන්වා දීමෙන් පසු හිඟ මුදල් අය කිරීම වෙනුවට අයකළ ඒකක මිල නිශ්චිත කර ගැසට් නිවේදනය සංශෝධනය කිරීමට කොමසාරිස්වරයා කටයුතු කර තිබුණි. ඒ හැර. විද්‍යුත් දැන්වීම් පුවරු 03කින් 2022 හා 2023 වර්ෂ සඳහා රු.671,000ක් අයකර නොතිබුණි. | පැවති ආර්ථික අර්බුදය නිසා ප්‍රතිපත්තිමය හා තීරණ ගැනීමට සහාය වීමේ කමිටුව විසින් රු.60ක් ලෙස නැවත සංශෝධනය කිරීමට කටයුතු කර තිබුණි. මේ වන විට ආර්ථික තත්ත්වය යහපත්ව පවතින බැවින් 2025 වර්ෂයේ දී නැවත ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කරන බවද වැඩිදුරටත් දන්වා සිටිමි. | ගාස්තු තීරණය කිරීම, අනුමත කිරීම, ප්‍රසිද්ධ කිරීම හා අය කිරීම විධිමත් කළ යුතු වේ. |
| (ආ) | පීඩාකාරී හෝ අන්තරාදායක කර්මාන්ත හෝ ව්‍යාපාර 94ක් 2022 වර්ෂයේ බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර 2022 හා 2023 වර්ෂවල දී එවැනි ආයතන 183ක් වෙනුවෙන් මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් නිරිදේශ ලබා දී නොතිබීම නිසා බලපත්‍ර ලබා දීමට නොහැකි වීමෙන් | 2022 වර්ෂයේදී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කොවිඩ් එන්නත් ලබා දීම මෙන්ම 2021 හා 2022 වර්ෂවල පාසැල් දරුවන්ගේ සෞඛ්‍ය පරීක්ෂණ කටයුතු ද, සඳහා දැඩි ප්‍රමුඛතාවක් ලබා | පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | රු.1,347,000ක ආදායමක් අහිමි වී තිබුණි. | දීමට සිදු වී තිබුණි. | |
| (ඇ) | 2022 හා 2023 වර්ෂවලට අදාළ ව්‍යාපාර හා කර්මාන්ත බදු රු.2,821,000ක් අයකර නොතිබුණු අතර 2021 වර්ෂය හා ඊට පෙර වර්ෂවලට අදාළ හිඟ බදු පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණි. | 2022 වර්ෂය සඳහා බදු නොගෙවූ ව්‍යාපාර 69ක් සඳහා නඩු පවරා ඇත. 2023 වර්ෂයට අදාළ ව්‍යාපාර බදු හිඟ මුදල් අයකර ගනිමින් පවතී. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ මිශ්‍ර කසළ මෙට්‍රික් ටොන් 5318ක් පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව කසළ අංගනය තුළ විවෘත පරිසරයට මුදා හැර තිබුණි. මේ නිසා ප්‍රදේශයේ පාරිසරික හා සාමාජීය ගැටළු රැසකට හේතුවන පරිදි 2023 වර්ෂය තුළ අවස්ථා කිහිපයක දී ම, එම ස්ථානයේ ගිනි ගැනීම් සිදු වී තිබුණි. | අපද්‍රව්‍ය කළමණාකරණය ආරම්භ කළ දින සිට මෙම භූමියේ අපද්‍රව්‍ය විවෘතව බැහැරලීම කර ඇත. මේ සඳහා විවිධ ආයතන සම්බන්ධ කරගෙන තාක්ෂණික හා මූල්‍ය පහසුකම් ලබා ගනිමින් උපරිම උත්සාහයෙන් කටයුතු කෙරෙමින් පවතී. | විවෘත පරිසරයට කසළ බැහැර කිරීම අවම කළ යුතු වේ. |
| (ආ) | 2023 වර්ෂය තුළ එකතු කළ දිරන කසළ මෙට්‍රික් ටොන් 2,561කින් කොම්පෝස්ට් පොහොර මෙට්‍රික් ටොන් 46ක් පමණක් නිෂ්පාදනය කිරීම ගැටළුසහගතය. | කසළ මිනුම් ගැනීම උපකල්පිතය. යන්ත්‍ර ක්‍රියාකාරීත්වය දුර්වලය. ගබඩා පහසුකම් ඉක්මවා යාමේදී නිෂ්පාදනය සීමා කර ඇත. | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය විධිමත් කළ යුතු වේ. |

**3.2 අවිධිමත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අයාලේ යන ගවයින් රැගෙන යාමට පොළොන්නරුව, දම්මින්න ප්‍රදේශයේ ගොවිපොළ හිමිකරුවකු වෙත අවසර දී තිබුණි. එම කටයුතු නිරීක්ෂණය සඳහා නාගරික කොමසාරිස් ඇතුළු නිලධාරීන් 05 දෙනෙකු එම ප්‍රදේශයේ දෙදින සංචාරයක නිරත වී ඒ සඳහා රු.58,182ක් වැයකර තිබුණි. 2023 වර්ෂය තුළ ගවයින් 16 දෙනෙකු එලෙස රැගෙන ගොස් තිබුණ ද, එම සතුන් අදාළ ගොවිපොළ වෙත රැගෙන ගොස් නොතිබුණු අතර එම ගවයින් ජීවත්ව සිටීද යන්න පවා අවිනිශ්චිත විය. මෙවැනි ගවයින් ලබාදෙන ලෙස බල ප්‍රදේශයේ ලියාපදිංචි කිරි ගොවීන්ගේ ඉල්ලීම් තිබියදී ඒ පිළිබඳ නොසලකා පොලොන්නරුව ප්‍රදේශයේ ගොවිපොළ හිමිකරුවකු වෙත | මහා සභාවේ තීරණය මත රු.58,182ක් වැය කර ඇත. දිඹුලාගල පශු වෛද්‍ය නිළධාරී විසින් එළගවයින් අටදෙනෙකු එම කාර්යාලයේ නීත්‍යානුකූලව ලියාපදිංචි කළ බව ලිඛිතව දන්වා ඇත. | අයාලේ සැරිසරන ගවයින් ඉවත් කිරීම විධිමත් කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | අවස්ථාව සලසා දී තිබීම ප්‍රශ්නගත විය. | | |
| (ආ) | නාගරික කොමසාරිස්වරයා වෙත මාසික ප්‍රවාහන දීමනා හා ඉන්ධන දීමනා ලෙස එකතුව රු.2,597,380ක් 2021 ජූනි සිට සිට 2023 ඔක්තෝබර් දක්වා ගෙවා තිබියදී එම කාලය සඳහා රු.280,000ක පරිවර්තිත ගමන් වියදම් දීමනා ද ගෙවා තිබුණි. | පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක CS/07/04/01/01 හා 2019 ඔක්තෝබර් 24 දිනැති ලිපියට අනුව දීමනා ගෙවා තිබුණි. | මධ්‍යම රජයේ චක්‍රලේඛ ඉක්මවා කටයුතු කිරීම නිර්දේශ කළ නොහැක. |
| (ඇ) | පළාත් ප්‍රධාන ලේකම්ගේ උපදෙස්වලට පටහැනිව, ක්ෂේත්‍ර නිලධාරී ස්වරූපයේ තනතුරක් නොවන මහා නගර සභාවේ පරිපාලන නිලධාරී (ආයතන) තනතුර සඳහා 2019 නොවැම්බර් සිට 2023 ඔක්තෝබර් දක්වා පරිවර්තිත ගමන් වියදම් දීමනා ලෙස රු.90,000ක් ගෙවා තිබුණු අතර එම කාලය තුළ රාජකාරී සඳහා ඇය විසින් රජයේ වාහන ද භාවිතා කර තිබුණි. | ගිය දින ගණන හා වැය වූ ඉන්ධන ප්‍රමාණය පිළිගනිමි. වාර 04ක් සඳහා රු.2,000ක පරිවර්තන දීමනාවක් ගෙවනු ලබයි. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ ඉක්මවා කටයුතු කිරීම නිර්දේශ කළ නොහැක |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන 03ක් වෙන්දේසි කිරීම සඳහා ලද සියලු ලංසු, තීරණය කළ මිලට වඩා අඩු විය. පළ කළ පුවත්පත් දැන්වීමෙහි අවම ලංසු මිල සඳහන් නොකිරීම ඊට හේතුව වී තිබුණි. ඒ අනුව සියලු ලංසු ප්‍රතික්ෂේප කිරීමට තීරණය කර තිබුණු අතර මේ නිසා පුවත්පත් දැන්වීම වෙනුවෙන් වැය කළ රු.126,212ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන දැන්වීම සඳහා අවම මිල ඇතුළත් කිරීමට සටහන් කර ගන්නා ලදී. | වත්කම් අපහරණ කටයුතු විධිමත් කළ යුතු වේ. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 සහ 2023 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු අයකිරීමට වාර්ෂික ආදායම් ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කර ඒ සඳහා ප්‍රධාන ආදායම් පරීක්ෂක වෙත ලිඛිත රාජකාරී පැවරීමක් සිදුකර තිබුණ ද, සංවර්ධනය | සංවර්ධන නොකළ ඉඩම් මත අයකරන බදු සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | සභාව වෙත අයවිය යුතු ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | නොකළ ඉඩම් හඳුනාගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | පාරිභෝගිකයින් 1518 දෙනෙකුට ලබා දෙන පානීය ජලය වෙනුවෙන් කිසිදු ජල තත්ත්ව පරීක්ෂාවක් එම ව්‍යාපෘති ආරම්භ කල දින පටන් සිදුකර නොතිබුණි. | ජල ව්‍යාපෘති ආරම්භයේ සිට මේ දක්වා ජල තත්ත්ව පරික්ෂාවක් සිදු කර නොමැත. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ඉල්ලීම් කර ඇත. | ජලයෙහි ගුණත්වය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්නපුර නගරයේ ගැටි බැම් දැමීමට හා කුට්ටි ගල් ඇතිරීමේදී නොකළ වැඩ වෙනුවෙන් රු.340,615ක් ගෙවා තිබුණි. | රැඳවුම් මුදලින් හිලව්කර ගනිමි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතු වේ. |
| (ආ) | ඍජු ශ්‍රම පදනම මත ඉටුකළ පොල්හේන්ගොඩ මාර්ගය සඳහා ද්‍රව්‍ය ලබාගෙන තිබුණද, ද්‍රව්‍ය ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි. එමෙන්ම, වැඩ අවසන් වූ පසු තථ්‍ය මිනුම් ලබාගෙන වැය වූ ද්‍රව්‍ය පිළිබඳ වාර්තාවක් ද සකස් කර නොතිබුණි. මේ නිසා රු.451,488ක ද්‍රව්‍ය නිකුත් කිරීම්වල නිවැරදිතාව අවිනිශ්චිත විය. | පිළිතුරු දී නැත. | ඍජු ශ්‍රම පදනම මත කර්මාන්ත ඉටුකිරීම හා අධීක්ෂණය විධිමත් කළ යුතු වේ. |
| (ඇ) | රත්නපුර මහජන පුස්තකාලයේ උද්‍යාන අලංකරණ කටයුතුවල දී ශ්‍රමය වෙනුවෙන් රු.98,550ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදලට වඩා වැඩ කොන්ත්‍රාත්කරු වෙතින් ඉටු කරගෙන ඇති බැවින් අලාභයක් වී නොමැති බව. | වැඩිපුර ගෙවීම් ආපසු අයකරගත යුතු වේ. |
| (ඈ) | රත්නපුර මහජන පොළ ඉදි කිරීමේදී කොන්ක්‍රීට් වැඩ සඳහා මිල දී ගත් තවත් වාර 03ක් භාවිතා කළ හැකි රු.353,260ක් වූ ප්ලයිවුඩ් ලෑලි 87ක් හා දැව දික් අඩි1894ක් අස්ථානගත වී තිබුණි. | පිළිතුරු දී නැත. | කර්මාන්ත අධීක්ෂණය විධිමත් කළයුතු වේ. පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | රු.406,980කට මිල දී ගෙන 2022 වර්ෂයේ වහලයකට යෙදූ අමානෝ ෂීට් වර්ග අඩි 4350ක් 2024 ජනවාරි වන විට මළ බැඳී දිරාපත් වී තිබුණ ද, ප්‍රමිතීන්ට අනුකූල නොවූ එම මිල දී ගැනීම පිළිබඳ කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | පිළිතුරු දී නැත. | ප්‍රමිතීන්ට අනුකූල නොවන මිල දී ගැනීම් සම්බන්ධයෙන් පරික්ෂා කර වගකීම නිශ්චය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | තොග මත්ස්‍ය වෙළඳපොළ ඉදිකිරීමේදී රු.44,549ක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති මුදල අවසාන බිල්පතෙන් අය කර ගනිමි. | වැඩිපුර ගෙවීම් අයකර ගත යුතු වේ. |

**3.6 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත සේවක සඛ්‍යාව ඉක්මවා දරන්නාට පුද්ගලික වනසේ ස්ථිර කරන ලද කම්කරුවන් 157ක් සේවයේ යොදවා තිබියදී විධිමත් අනුමැතියකින් තොරව කම්කරුවන් 65ක් හා 40ක් සේවා ගිවිසුම් මත අදාළ ක්ෂේත්‍ර වෙත බඳවා ගෙන 2023 වර්ෂය සඳහා රු.23,800,865ක් වැටුප් ගෙවා තිබුණි. අතිරික්ත සේවකයින් වැඩි දෙනෙකු පරිපාලන කාර්යාලයේ, පුස්තකාලවල හා පෙර පාසැල්වල නිශ්චිත වැඩ පැවරුමකින් තොරව සේවයේ යොදවා තිබුණි. | පුස්තකාල කාර්ය මණ්ඩලය හා පෙර පාසල් වෙත යොදවා ඇති සේවා ගිවිසුම් සේවකයින් දෙදෙනා වෙනුවෙන් ද රාජකාරි පැවරීම් සිදුකර ඇත. | අතිරික්ත සේවකයන් සඳහා විධිමත් අනුමැතියක් ලබාගත යුතු අතර සියලු සේවකයන් ඵලදායී ලෙස සේවයේ යෙදවිය යුතු වේ. |
| (ආ) | අනුමත පරිපාලකයින් ගණන 10ක් වුවද, ලිඛිත රාජකාරී පැවරීමකින් ද තොරව නිත්‍ය තනතුර කම්කරු වූ 29 දෙනෙකු වැඩ පරිපාලක කාර්යයෙහි යොදවා තිබුණි. සත්‍ය වශයෙන් රාජකාරියේ නිරත වන 57දෙනෙකුගේ වැඩ අධීක්ෂණයට වැඩ පරිපාලකයින් 29 දෙනෙකු යොදවා තිබීම ප්‍රශ්ණගත විය. | කම්කරු පත්වීම් ලද සේවකයන් පරිපාලක ලෙස කාලයක් තිස්සේ රාජකාරී ඉටු කරනු ලබයි. පුරප්පාඩු වන පරිපාලක 05 දෙනා පිරවීම ඉදිරියේ දී සිදු කරන අතර වැඩ ක්ෂේත්‍ර පරිපාලක ලෙස සිටින අනෙක් 09 දෙනා වැඩ ක්ෂේත්‍ර කම්කරු ලෙස සේවයට එක් කරන බව දන්වමි. | සියලු සේවකයන් ඵලදායී ලෙස සේවයේ යෙදවිය යුතු වේ. |
| (ඇ) | රත්නපුර මහජන පුස්තකාලය ඇතුළුව පුස්තකාල 18කින් 12කම සක්‍රීය පාඨක සංඛ්‍යාව 06ත්15ත් අතර කුඩා සංඛ්‍යාවක් විය. එක් පුස්තකාලයක කිසිඳු සක්‍රීය සාමාජිකයෙකු නොවීමෙන් එහි සේවකයින් සඳහා ගෙවන රු.994,200ක වාර්ෂික වැටුප් නිෂ්ඵල වියදමක් වී තිබුණි. එමෙන්ම, රත්නපුර මහජන පුස්තකාලයට සඳහා කම්කරුවන් 11 දෙනෙකු සේවයේ යොදවා තිබීමෙන් අතිරික්ත කම්කරුවන් 06ක් වෙනුවෙන් වාර්ෂිකව රු.3,045,430ක් නිෂ්ඵල ලෙස වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | එක් පුස්තකාලයක් වසා එය කසළ එකතු කිරිමේ මධ්‍යස්ථානයක් ලෙස පවත්වාගෙන යාමට කමිටු තිරණ ලැබී ඇත. රත්නපුර මහජන පුස්තකාලයේ පවිත්‍රතා කටයුතු ඇතුලු සියලු කාර්යයන් ඉටු කළ යුතු බැවින් මෙම සේවක පිරිස ඵලදායිව සේවයේ යොදවා ඇත. | සභාව සතු වත්කම් හා මානව සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |

**3.7 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු වැඩ අධිකාරීවරයකුගේ හා ලොරි රියැදුරෙකුගේ වරදින් සිදු වූ අනතුරකින් යතුරු පැදියකට සිදු වූ රු.108,750ක හානිය ඔවුන්ගෙන් අයකර නොතිබුණු අතර රක්ෂණ ප්‍රතිලාභය ද ලැබී නොතිබුණි. අබලන් වූ යතුරු පැදිය ගබඩාව තුළ අභාවිතව පවතී. | මෙ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සඳහා පත් කළ කමිටුවේ වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කරමි. රක්ෂණ වන්දි මුදල් සඳහා කටයුතු සිදු කිරීමට නොහැකි බව රක්ෂණ ඔම්බුඩ්ස්මන් දන්වා ඇත. | වගකීම් නිශ්චය කර හානිය අයකළ යුතු වේ. |

**3.8 දක්ෂතා අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ගොඩනැගිල්ල නවීකරණයේදී මිල දී ගත් රු.971,631ක විදුලි උපාංග අස්ථානගත වී තිබුණි. | පිළිතුරු දී නැත. | වගකීම නිශ්චය කර අලාභ අයකළ යුතු වේ. |